ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

இலங்கை சமுத்திர பகலைக்கழகம்

The Ocean University of Sri Lanka

2023

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

අධ්‍යාපන අමාත්‍යාංශය,
නිපුණතා සංවර්ධන හා විෘත්තීය අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு
திறன் அபிவிருத்தி மற்றும் தொழில்சார் கல்வி பிரிவு
Ministry of Education,
Skills Development & Vocational Education Division

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2023

අධ්‍යාපන අමාත්‍යාංශය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.
දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

වෙබ් අඩවිය: www.ocu.lk

පටුන

01. දැක්ම, මෙහෙවර ප්‍රකාශය

02. පාලන මණ්ඩලය /ශාස්ත්‍රීය සභාව සහ ප්‍රධාන කළමණාකාරිත්වය

03. උපකුලපති පණිවුඩය

04. දළ විශ්ලේෂණය

04.1 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු

04.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය සහ සේවා දායකත්වය

05. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - කාර්ය සාධනය **2023**

05.1 අධ්‍යයන අංශ

05.1.1 උසස් අධ්‍යයන

05.1.2 වෘත්තීය තාක්ෂණ

05.2 විශ්වවිද්‍යාල සමාජීය වගකීම් - ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්

05.3 විශ්වවිද්‍යාල පාලනය

05.4 පාලන අංශ ප්‍රගතිය

05.5 අභ්‍යන්තර විගණන අංශය

06. විගණන හා කළමනාකරණ කමිටුව - කාර්ය සාධනය **2023**

07. විශ්ලේෂණාත්මක මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය **2023**

08. විගණිත මූල්‍ය ප්‍රකාශන

09. විගණකාධිපති වාර්තාව

10. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

11. මූල්‍ය විග්‍රහය - **2013 – 2022** වසර **10** ක කාලසීමාව

01. දැක්ම, මෙහෙවර ප්‍රකාශය

දැක්ම

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

මෙහෙවර

කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

1. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

2. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

3. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

4. ධීවර, සාගර විද්‍යාත්මක,සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

5. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

6. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

7. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

02. පාලන මණ්ඩලය

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 19 (1) උප වගන්තිය යටතේ පාලන මණ්ඩලය පිහිටුවා ඇත.

	නිල බලයෙන් පත්වන	
01.	මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	සභාපති:උපකුලපති
02.	ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය
03.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	පීඨාධිපති ,ධීවර හා සාගර විද්‍යා පීඨය
04.	එස්. එම්.එස්.ඩී. ගුණසිංහ මහතා	අධ්‍යක්ෂ (සැපයුම් හා ප්‍රසම්පාදන) , නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය
05.	එච්.පී. සෝමතිලක මහතා	අධ්‍යක්ෂ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
06.	ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා	අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) , උසස් අධ්‍යාපන අංශය ,අධ්‍යාපන අමාත්‍යාංශය
07	අජිත් සෙනෙවිරත්න මහතා	අධ්‍යක්ෂ ජනරාල්, (2020.06.12) වෙළඳ නාවික ලේකම් කාර්යාලය
08.	ඉංජිනේරු සනත් පනවෙන්නගේ මහතා	අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
09.	ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා	අතිරේක ලේකම් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
10.	(1) ඒ.ටී. උපාලි කැප්පෙටිපොළ මහතා (2) එයාර්. වයිස්. මාර්ෂල් (විශ්‍රාමික) ප්‍රසන්න රණසිංහ මහතා	(1) සභාපති, (2023.02.21) (2) සභාපති, (2023.06.05 දින සිට) වෘත්තීය පුහුණු අධිකාරිය
11.	මහාචාර්ය ජයන්ත විජේරත්න මහතා	සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
12.	ඩබ්. රුචික අමරසේකර මහතා	සභාපති, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
13.	ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා	අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
	පත්කළ සාමාජික	
14.	ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
15.	(1) සාලිය වික්‍රමසූරිය මහතා (2) මහාචාර්ය පී. ආර්.ටී. කුමාරණතුංග මහත්මිය	පාලන මණ්ඩල සාමාජික (2022.01.27) පාලන මණ්ඩල සාමාජික (2023.04.24 දින සිට)
16.	(1) මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා (2) ඉංජිනේරු ඩී.වී. අබේසිංහ මහතා (3) ආරියසිරි විතානගේ මහතා (4) ආචාර්ය. එන්.සී. කුමාරසිංහ මහතා	පාලන මණ්ඩල සාමාජික, සභාපති,ජාතික විද්‍යා පදනම (2023) පාලන මණ්ඩල සාමාජික, කොළඹ නැව් තාටාකාංගනය (2023.04.19) පාලන මණ්ඩල සාමාජික (2023.01.26) පාලන මණ්ඩල සාමාජික (2023.06.06 දින සිට)
17.	හෙක්ටර් හේමචන්ද්‍ර මහතා	පාලන මණ්ඩල සාමාජික (2023.07.13)
18.	ජේ.එම්.වයි.එස්.ජේ. බණ්ඩාර මහත්මිය	පාලන මණ්ඩල සාමාජික (2023.06.02 දින සිට)
19.	ආරියසීල වික්‍රමනායක මහතා	පාලන මණ්ඩල සාමාජික (2023.04.24 දින සිට)
20.	හේමන්ත රත්නායක මහතා	ලේකම්: ලේඛකාධිකාරී

ශාස්ත්‍රීය සභාව

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 24 (1) උප වගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව පිහිටුවා ඇත.

01.	මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	සභාපති : උපකුලපති ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
02.	ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	පීඨාධිපති,ඉංජිනේරු හා කළමනාකරණ පීඨය, අධ්‍යක්ෂ - ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව
03.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	පීඨාධිපති, ධීවර හා සාගර විද්‍යා පීඨය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
04.	පී.යූ.අයි. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පුහුණු),ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
05.	හේමන්ත රත්නායක මහතා	ලේකම්: ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
06.	එච්.කේ.ආර්. තුෂාර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
07.	ආචාර්ය එම්.පී. කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
08.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	අංශ ප්‍රධානී,සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
09.	01. ආචාර්ය නේශා දුශානි මහත්මිය 02.ආචාර්ය එන්.පී.ජී. පුෂ්පිත මහතා (2023 ඔක්තෝම්බර් මස සිට)	අංශ ප්‍රධානී, ධීවර හා සමුද්‍රීය විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
10.	බී.ඒ.එන්. ඉන්දිකා මහත්මිය	අංශ ප්‍රධානී, ජලජීව් වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
11.	එම්.සී.එල් .සොයිසා මහත්මිය	අංශ ප්‍රධානී, වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධි අංශය,ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
12.	01. එච්.ඩි.එම්.එම්. පුස්සැල්ල මහත්මිය 02. සමුදිතා ගනේපොල මෙනවිය (වැඩ බලන)	අංශ ප්‍රධානී, නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි අංශය,ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
13.	ඉංජිනේරු ඊ.පී. රොහාන් මහතා (වැඩ බලන)	අංශ ප්‍රධානී, නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
14.	ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
15.	ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
16.	ආචාර්ය නේශා දුශානි මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
17.	පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය	කථිකාචාර්ය, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය

ප්‍රධාන කළමණාකාරිත්වය

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ iv වන කොටසේ විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන් පිළිබඳ සඳහන් වේ. ඒ අනුව, 2023 වසරේදී විශ්වවිද්‍යාලයීය ප්‍රධාන කළමණාකාරිත්වය පහත පරිදි වේ.

01.	*කුලපති*	*මහාචාර්ය ඔස්කා අමරසිංහ මහතා*
02.	*උපකුලපති*	*මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා*
03.	*පීඨාධිපති (ඉංජිනේරු හා කළමනාකරණ පීඨය)*	*ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා*
04.	*පීඨාධිපති (ධීවර හා සාගර විද්‍යා පීඨය)*	*ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය*
05.	*ලේඛකාධිකාරී*	*ආර්.එස්. හේමන්ත රත්නායක මහතා*
06.	*අධ්‍යක්ෂ මුදල්*	*රෝහිණි විද්‍යාරත්න මහත්මිය (2023.11.13 දින දක්වා)*
07.	*අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව*	*ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා*
08.	*අධ්‍යක්ෂ පුහුණු*	*පී.යූ.අයි. පෙරේරා මහතා*

03. උපකුලපති පණිවුඩය



2023 වර්ෂය සඳහා සාගර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථාව උදාවීම ප්‍රීතිය දනවන කරුණකි. 2023 වසරේ වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම් තුළ සාගර විශ්වවිද්‍යාලය 17 වන ස්ථානයට එක්වීම ද සටහන් කරණුයේ හද පිරි සතුටිනි.

උසස් අධ්‍යයන අවස්ථා පුළුල් කරමින් දුරස්ථ අධ්‍යයන උපාධි පාඨමාලාවන් සහ පශ්චාත් උපාධි අධ්‍යයන අංශයේ විද්‍යාපති උපාධි පාඨමාලා සමාරම්භය සනිටුහන් කිරීමට ඉඩ ප්‍රස්ථා සැළසීම මෙන්ම පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් ද වසර තුළදී ආරම්භ කිරීමට හැකිවීම විශ්වවිද්‍යාලය තැබූ සාධනීය ඉදිරි පියවරයන් සේ සටහන් තබමි.

උපාධි පාඨමාලා ගුණාත්මක තත්ත්වයන් ඉහළ නංවා ගැනීම සඳහා වසර තුළදී ක්‍රියාත්මක වූ අතරම, නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය (CDC) ලබාදීමට මූලිකත්වය ගෙන කටයුතු කළ වසරකි.

වසර තුළදී සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශය ප්‍රථම උසස් ඩිප්ලෝමා (NVQ Level 6) පාඨමාලාව ආරම්භ කිරීම ද, ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් පාඨමාලා පැවැත්වීම සහ පෙර දැනුම් ඇගයීම් ක්‍රමය (RPL) යටතේ පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් ලබාදීමේ කටයුතු සම්පාදනයට මූලික පියවර ගැනිමත් විශේෂිතව සැළකිමට බඳුන් කළ යුතු කරුණු වේ.

විශ්වවිද්‍යාලය සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ස්ථාපිත කර ශිෂ්‍ය ප්‍රජාව පෞරුෂත්වයෙන් හා දැනුම කුසලතා ආකල්ප වලින් පරිපූර්ණ කිරීමේ කාර්යය සහ **"සිත් අරණ"** ශිෂ්‍ය සහන ඒකකය ස්ථාපිත කර ශිෂ්‍ය සුවතා පවත්වා ගෙන යාමේ අවස්ථාව ලබා දී අධ්‍යාපනයේ ගුණාත්මක පැතිකඩ වර්ධනය කර ගැනීම සඳහා දරන ලද උත්සාහයන් වේ.

වාර්ෂිකව පවත්වනු ලබන පර්යේෂණ සමුළුව මඟින් පර්යේෂණ දැනුම සමාජගත කිරීමටත් ඒ සඳහා ශිෂ්‍ය හා අධ්‍යයන කාර්ය මණ්ඩලය යිවර, නාවික හා සාගරය සබැඳි පර්යේෂණ කාර්යයන් කෙරෙහි උනන්දු කරවීම සඳහා ද කටයුතු කෙරුණි.

විශ්වවිද්‍යාලයේ පද්ධතීන් ක්‍රමිකව ඩිජිටල් පරිවර්තන කළමනාකරණ ක්‍රමවේදයට ඇතුළත් කිරීම සඳහා මූලික කටයුතු සම්පාදනය කර කාර්ය මණ්ඩලයේ ඩිජිටල් සාක්ෂර කුසලතා සංවර්ධනය කිරීමට පුහුණු සැසි පැවැත්වීමට ක්‍රියා කෙරිණි.

ඒසේම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුල විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රතිපාදන කළමනාකරණය ක්‍රමවත්ව සිදු වී ඇති බව විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ විගණික මතයක් ජාතික විගණන කාර්යාලය ලබාදීම මත නිරූපණය වන බව පෙන්නුම් කෙරේ.

විශ්වවිද්‍යාලයීය විගණන අංශය රේඛීය අමාත්‍යාංශය හා රජයේ විගණන අංශය සමඟ සම්බන්ධීකරණයෙන් විශ්වවිද්‍යාලයීය පද්ධතියන්හී පවත්නා දුර්වලතා අවම කර ගැනීමට වසර තුළදී දක්වන ලද සහයෝගය ද විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

මේ අනුව, විශ්වවිද්‍යාලය පිළිබඳ වසර තුළ සමස්ථ ක්‍රියාත්මක වීම විශ්ලේෂණයේදී විශ්වවිද්‍යාලයීය තත්ත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරීව උපරිම දායකත්වය සැපයූ පාලන මණ්ඩලයට,ශාස්ත්‍රීය සභාවට සහ කාර්ය මණ්ඩලයට ද මාගේ කෘතඥතාවය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.


2024 වසර සමස්ථ කාර්ය මණ්ඩල සහයෝගිතාවයෙන් ජයග්‍රහණ සහිරි වසරක් බවට පරිවර්තනය කිරීමේ සක්‍රීය දායකත්වය පෙරදැරිව මෙම සටහන අවසන් කරමි.

මහාචාර්ය වසන්ත රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15.

මහාචාර්ය වසන්ත රත්නායක,Ph.D
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

04. දළ විශ්ලේෂණය

04.1 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2014 අංක 31 දරණ පනත මඟින් ස්ථාපිත වී ශ්‍රී ලංකාවේ ධීවර,සාගර, සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර,සාගර, විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක,තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දෙස් විදෙස් පිළිගත් උසස් අධ්‍යාපන දැනුමක් ලබා දීමේ ජාතික වගකීම ඉටු කරනු ලබන්නේය.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය ක්‍රියාත්මක වන අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රය, නාවික හා සාගරය පිළිබඳ පර්යේෂණ සඳහා අවශ්‍ය මානව සම්පත සපයන කාර්යභාරයේ නිරත වේ.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ප්‍රදානය කිරීම ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාව ද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ඉදිකිරීම් සහ නාවික වාස්තු විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී. ක්‍රමිකව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුළ වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසුන්ට උසස් අධ්‍යයන අවස්ථා ලබා දීම පුළුල් කිරීම සඳහා විවිධ උපාධි පාඨමාලා හඳුන්වා දීම සිදු විය.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත විය.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2023 වසරේදී දුරස්ථ අධ්‍යයන අවස්ථා පුළුල් කරමින් උපාධි පාඨමාලා 02 ක් හඳුන්වා දුන් අතරම, විශ්වවිද්‍යාලයේ ඉදිරි ගමන් මඟෙහි නවමු සටහනක් තබමින් පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මඟින් විද්‍යාපති උපාධි පාඨමාලා ද ආරම්භ කරන ලදී.

2023 වසරේදී හඳුන්වා දුන් විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍ර උපාධි පාඨමාලා විශ්වවිද්‍යාලයීය උසස් අධ්‍යයන අංශයේ පරාසයන් පුළුල් කරමින් ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනය සඳහා මානව සම්පත් සැපයීම ප්‍රමුඛ කොට ක්‍රියාත්මක වූ අතර සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා නිපුණතා පුර්ණ ශ්‍රමික අවශ්‍යතාවයන් ඉලක්ක කර මෙම පාඨමාලා හඳුන්වා දෙන ලදී.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය:

උසස් අධ්‍යයන අංශය	වෘත්තීය තාක්ෂණ අංශය
ධීවර හා සාගර විද්‍යා සහ ඉංජිනේරු සහ කළමනාකරණ පීඨ	ප්‍රාදේශිය මධ්‍යස්ථාන
නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය 2003	 මීගමුව 1963
ධීවර හා සමුද්‍රීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය 2003	 තංගල්ල 1972
නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය 2014	 මඩකලපුව 1972
වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය 2015	 යාපනය 1972
සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය 2019	 මට්ටක්කුලිය 1975
ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය 2020	 ත්‍රිකුණාමලය 1993 1999 ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය
දුරස්ථ අධ්‍යයන උපාධි පාඨමාලා 2023 01. සැපයුම් දාම කළමනාකරණ 02. ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී	 ගාල්ල 2006
පශ්චාත් උපාධි පාඨමාලා 2023 වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය	 කළුතර 2008 පානදුර 2020

04.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය:

ශ්‍රී ලංකාවේ ධීවර,සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ ධීවර, සාගර විද්‍යාත්මක,සමුද්‍රීය තාක්ෂණ සහ සමාන ක්ෂේත්‍රවල නියැලි සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සහ එකී ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා මඟින් ලබාගන්නා උසස් අධ්‍යාපන සුදුසුකම් දේශීය හා විදේශීය පිළිගැනීම සහතික වීම හා දෙනු ලබන දැනුම රටේ සංවර්ධනය උදෙසා භාවිතයට ගැනීම.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන අංශය සමන්විත වන පීඨ:

ධීවර හා සාගර විද්‍යා පීඨය තංගල්ල	**ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය මට්ටක්කුලිය**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08:


තංගල්ල	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල
ගාල්ල	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, 284/ ඒ, ගාලු පාර , බූස්ස, ගාල්ල
පානදුර	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,දොඹගහවත්ත,උයන්කැලේ පාර,පානදුර
මට්ටක්කුලිය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදුපත, මට්ටක්කුලිය, කොළඹ15.
මීගමුව	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,වැල්ලවිදිය, මීගමුව
මඩකලපුව	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව
ත්‍රිකුණාමලය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩබේ,චීන වරාය,ත්‍රිකුණාමලය
යාපනය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් විදිය,ගුරු නගර් ,යාපනය

සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



05. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - කාර්ය සාධනය 2023

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම දැක්ම මූලිකව කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීමේ මෙහෙවර පෙරදැරිව 2014 අංක 31 දරන විශ්වවිද්‍යාල පනතේ අරමුණු සාක්ෂාත් කර ධීවර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරා ලීමේ කාර්යභාරය අරමුණු සහගතව 2023 වසරේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ අංශයන්ගේ ප්‍රගතිය,

05.1. අධ්‍යයන අංශ

05.1.1. උසස් අධ්‍යයන

05.1.2 වෘත්තීය තාක්ෂණ

05.2. විශ්වවිද්‍යාලයීය සමාජීය වගකීම් - ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්

05.3 විශ්වවිද්‍යාල පාලනය

05.4 පාලන අංශ ප්‍රගතිය

05.5 අභ්‍යන්තර විගණන අංශය

.....

මහාචාර්ය වසන්ත රත්නායක,Ph.D
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

මහාචාර්ය වසන්ත රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15.

එල්.ඒ.කේ.සී.කේ. ලියනාරච්චි මහතා
අධ්‍යක්ෂ පුහුණු (වැ.බ),
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ
පීඨාධිපති,
ධීවර හා සාගර විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

Dr. W.A.A.D. Lanka Wickrmasinghe
BSc.(Hons) SL,MSc.VUB-Belgium,PhD.CIFE-India
Dean
Faculty of Fisheries and Ocean Sciences,
Ocean University of Sri Lanka,
Mattakkuliya, Colombo - 15

ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස
පීඨාධිපති,
ඉංජිනේරු හා කළමනාකරණ
පීඨය
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

Dr. S.U.P. Jinadasa
Dean
Faculty of Engineering and Management
The Ocean University of Sri Lanka
Crow Island, Colombo 15.

05.1 අධ්‍යයන අංශ

05.1.1 උසස් අධ්‍යයන



2023 වසර තුළදී සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය යටතේ උපාධි පාඨමාලා 06 ක්, තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක් ද ඇතුළත්ව ක්‍රියාත්මක විය. ධීවර හා සාගර විද්‍යා පීඨය යටතේ ධීවර හා සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යා සහ ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා පැවැත්වූ අතර, ඉංජිනේරු හා නාවික කළමනාකරණ පීඨය යටතේ නාවික ඉංජිනේරු, නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමනාකරණ, වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලා ක්‍රියාත්මක විය.


වසර තුළ දී විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මඟින් සැපයුම්දාම කළමනාකරණ හා ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා දෙක (02) ද ,පශ්චාත් උපාධි අධ්‍යයන අංශය මඟින් වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ද ආරම්භ කෙරිණි.

2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) සහ අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල පදනම්ව ද අනෙකුත් උපාධි පාඨමාලා සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කෙරේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශයේ උපාධි පාඨමාලා අභ්‍යන්තර බඳවා ගැනීම් මත පමනක් ක්‍රියාත්මක වූ අතර, 2023 වර්ෂයේ සිට බාහිර උපාධි පාඨමාලා ගාස්තු අයකිරීම් මත පවත්වා ගෙන යාමට කටයුතු කෙරිණි.

වගුව අංක 1 - ශිෂ්‍ය ලියාපදිංචිය

අනු අංකය	පීඨය	විද්‍යාවේදී උපාධි වැඩසටහන්	ශිෂ්‍ය සංඛ්‍යාව						
			2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023	2023/2024
01	ඉංජිනේරු හා කළමනාකරණ	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	40	37	47	50	46	56	63
02.		නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	47	53	53	73	83	51	53
03.		වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය	40	45	55	65	54	49	54
04.	ධීවර හා සාගර විද්‍යා	ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	41	41	49	59	68	49	53
05.		සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය			26	23	23	23	35
06.		ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය				40	76	65	70
07.	විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය	සැපයුම් දාම කළමනාකරණ උපාධිය							86
		ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය							65
08.	පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය	දර්ශනසූරි							1
		දර්ශනපති							1
		වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ විද්‍යාපති උපාධිය							15
		වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා							5



වගුව අංක 2 - උපාධිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව

	උපාධි පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව						
		2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023	2023/2024
01.	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	10	36	**33**	43	**37**	**56**	58
02.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	15	44	51	69	82	48	53
03.	වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය	14	31	49	60	48	**46**	**53**
04.	ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය		11	35	48	65	49	49
05.	සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය	-	-	19	19	14	**20**	**30**
06.	ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය	-	-	-	37	**71**	**64**	70
07.	**විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය**							
	සැපයුම් දාම කළමනාකරණ උපාධිය							76
	ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය							65
08.	**පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය**							
	දර්ශනසූරි							1
	දර්ශනපති							1
	වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ විද්‍යාපති උපාධිය							10
	වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා							5

05.1.1.1 ආයතනික පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම.

ධීවර හා සමුද්‍රීය විද්‍යා උපාධි පාඨමාලාව හදාරා අවසන් වන සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබේ.මෙම වසරේදී සිසුන් 35 දෙනෙකු (2019/2020 කණ්ඩායම) රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනික පුහුණුව සඳහා යොමු කර ඇත.

05.1.1.2 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය

වගුව අංක 3 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා	B.Sc. (Ruhuna,SL), M. Phil (Ruhuna,SL), D. Sc (Shizuoka, Japan)
02.	ආචාර්ය එම්. පී. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), Ph. D (Edinburgh Napier, UK)
03.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මහත්මිය	B.Sc. (Hons) (Ruhuna, SL), M.Sc. (Vrije, Belgium) Ph.D. (ICAR-CIFE, Mumbai, India)
04.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	B.Sc. in Physical Science (Peradeniya, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya, SL)

05.	ආචාර්ය එස්. එන්. දුෂානි මහත්මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (UiT, Norway), Ph. D scholar (UiT, Norway)
06.	ආචාර්ය එස්.පී.යූ. ජිනදාස මහතා	B.Sc. in Special in Geology (Peradeniya, SL), (MPhil) Applied Geophysics (Open University SL), Doctor of Philosophy Physical Oceanography (Ruhuna, SL)
කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එන්. පී. ජී. පුෂ්පිත මහතා	B.Sc. (Hons), (Ruhuna, SL) MPhil (Ruhuna, SL), M.Sc. (KMOU Korea), Ph.D. (Ruhuna, SL)
02.	බී.ඒ. එන්. ඉන්දිකා මහත්මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (PNU,Korea) M.Sc. (Jayawardhanapura, SL)
03.	ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (James Cook, Australia)
04.	එම්. අයි. යූ. මාණික්කආරච්චි මහත්මිය	B.Sc. (Hons) (Ruhuna, SL), M.Sc. (WMU, Sweden)
05.	ටී.ඩබ්.එස්. වර්ණසුරිය මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (Colombo, SL)

වගුව අංක 4 -ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්‍ය්‍ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එච්.බී.ජයසිරි මහතා	B.Sc. in Biological Science (Ruhuna, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India)
02.	ඉංජිනේරු ඊ.පී. රොහාන් මහතා (කොන්ත්‍රාත් පදනම)	B.Sc. in Engineering (Ruhuna,SL), MPhil (Ruhuna,SL), Doctor of Engineering (Ruhuna,SL)
කථිකාචාර්යවරුන්		
01.	එම්.සී.එල් .සොයිසා මහත්මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL), Master of Science Korea Maritime and Ocean University
02.	ඊ.ඒ.කේ.කේ. අමරසේකර මහත්මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
03.	එච්.ඒ.පී.එස්.ජයපාල මහත්මිය	B.Sc. in Degree (Open SL), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura, SL), Master of Science Korea Maritime and Ocean University
04.	පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය	B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL), M.Sc. in Environmental Science (Open University, SL)
05.	ඒ. සුරේෂ් මහත්මිය	B.Sc. (Special) in Environmental Sciences, Vauniya Campus of the (University of Jaffna, SL), M.Sc. in Environmental Science (Peradeniya, SL), Master of Science Korea Maritime and Ocean University
06.	ඩී.එස්.මානගේ මහත්මිය	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Business Administration

07.	එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මහත්මිය	B.Sc. (Hons) in Business Administration (Peradeniya, SL), M.Sc. in Management university of Sri Jayawardhanapura
08.	ටී.පී.ජී.එන්.අසන්ත ද අල්විස් මහතා	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), Master of Science Korea Maritime and Ocean University
09.	ජී.ඒ.එස්. චතුරි ගනේපොල මෙනෙවිය	Master of Business Administration, University of Colombo, Bachelor of Business Administration in Business Economics, University of Colombo Passed Finalist in Charted Institute of Management Accountants (CIMA)
10.	ඩබ්.පී.ඩබ්.අංජලිකා මහත්මිය	B.A. in Economics (Special) Degree University of Sabaragamuwa
11.	අයි.සී. කිරින්දගෙදර මහත්මිය (කොන්ත්‍රාත් පදනම)	B.Sc. in Engineering (Peradeniya,SL),M.B.A. (Moratuwa,SL)

05.1.1.3 අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ පර්යේෂණ හා ප්‍රකාශන 2023

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් යොමු ගත සුවිගත වාර සඟරා ලිපි සහ යොමු ගත සුචි ගත නොකළ වාර සඟරා ලිපි ප්‍රකාශයට පත් කර ඇත. කාර්ය මණ්ඩලයේ සියලුම ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් වගුවේ දක්වා ඇත.

වගුව අංක 5 : අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්

පීඨය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
ධීවර හා සාගර විද්‍යා පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			**03**
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව	**01**	
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	**19**	
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද			**03**
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		

ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			**03**
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව		
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	**21**	
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද		**01**	
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		

වගුව අංක **6 :** අනධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්

විධායක කාර්ය මණ්ඩලය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව	**01**	
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	**01**	

05.1.1.4 ප්‍රගතිය

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය සිව්වන උපාධි ප්‍රදානෝත්සවය 2023.10.31 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී පවත්වා උපාධිලාභී සිසුන් 146 දෙනෙකු සඳහා උපාධි ප්‍රදානය සිදු කිරීම.






	පීඨය	උපාධි පාඨමාලාව	සංඛ්‍යාව
01.	ඉංජිනේරු හා කළමනාකරණ	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	34
		නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	41
		වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය	33
02.	ධීවර හා සාගර විද්‍යා	ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය	38
එකතුව			**146**

❖ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (Centre for Open and Distance Learning) මඟින් විවෘත හා දුරස්ථ අධ්‍යාපන අවස්ථා (Distance Learning) පුළුල් කරමින් සැපයුම් දාම කළමනාකරණ උපාධිය (B.Sc. in Supply Chain Management) හා ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය (B. Tech in Aquaculture and Seafood Technology) 2023.02.15 දින ආරම්භ කර පවත්වාගෙන යාම.





❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2019 වසරේ සිට විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ සංසදයේ සාමාජිකයකු වන අතර, විශ්වවිද්‍යාල 17 ක සාමාජිකත්වයෙන් යුතු මෙම සංසදය මඟින් විශ්වවිද්‍යාල අධ්‍යයන හා පරිපාලන කටයුතු පිළිබඳ රාජ්‍ය හා අනෙකුත් අංශයන් සමග සම්බන්ධීකරණය වී කටයුතු සිදු කරනු ලැබේ. මාසිකව පවත්වනු ලබන රැස්වීම් සඳහා සාමාජික විශ්වවිද්‍යාල මඟින් අනුග්‍රහය දක්වනු ලබන අතර, 2023 වසරේ මාර්තු මස 31 වන දින හා 01 යන දිනයන්හී සංසද රැස්වීමේ සංවිධාන කටයුතු සාගර විශ්වවිද්‍යාලය වෙත පිරිනැමිණි.





❖ උසස් අධ්‍යයන අංශයේ උපාධි පාඨමාලා සඳහා 2022 වර්ෂයේ ශිෂ්‍ය බඳවා ගැනීමේ සමාරම්භක උත්සවය 2023 මාර්තු මස 27 වන දින ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.

❖ වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ පශ්චාත් උපාධි (MSc. in Coastal Resource Economics and Management) පාඨමාලාව 2023.07.07 වන දින ආරම්භ කිරීම.





❖ සාගර විශ්වවිද්‍යාලයේ 5 වන පර්යේෂණ සමුළුව 2023.11.23 දින පැවැත්වීම සහ පර්යේෂණ පත්‍රිකා සාරාංශ 41 ක් සමුළුව වෙත ඉදිරිපත් වීම.

❖ කොරියාවේ ජාතික කොරියා නාවික හා සාගර විශ්වවිද්‍යාලය (National Korea Maritime & Ocean University) සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර, අධ්‍යාපනික සහයෝගිතා ගිවිසුමට එළඹීම 2022.03.21 දින සිදුකර, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ KMOU අධ්‍යාපනඥයින් සමඟ දැනුම බෙදා ගැනීම සඳහා වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සිසුන් 12 දෙනෙකු Korea Maritime සහ Ocean University (KMOU) වෙත සති තුනක අධ්‍යයන චාරිකාවක් සඳහා යොමු කිරීම.

❖ කොරියානු රාජ්‍ය අනුග්‍රහ ශිෂ්‍යත්ව යටතේ වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලා හදාරනු ලබන සිසුන් සඳහා උසස් අධ්‍යයන අවස්ථා හිමිකර දීම.

❖ කොරියා මැරිටයිම් (Korea Maritime) විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ විශේෂවේදී උපාධි පාඨමාලාවේ විෂය මාලා සංවර්ධන කටයුතු විශේෂිත විෂය ක්ෂේත්‍ර 03 ක්, (ජෛව තාක්ෂණ විද්‍යාව - Biotechnology, වෙරළබඩ පරිසරය - Coastal Environment සහ වෙරළබඩ පරිසර විද්‍යාව - Coastal Ecology) ආවරණය වන අයුරින් සිදු කිරීම සඳහා සැළසුම් කර අදාළ විෂය මාලා සංවර්ධන කටයුතු වසර තුළදි නිම කර විශේෂඥ කමිටුවක් වෙත සමාලෝචන කටයුතු සඳහා යොමු කිරීම.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය උපාධි පාඨමාලාවන්හී ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා IMarEST සාමාජිකත්වය යාවත්කාලීන කිරීම, නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා වසර 03 ක කාලසීමාවක් සඳහා ලබා දී ඇති ISO 9001-2015 (Bureau Veritas Certification) තත්ත්ව සහතිකය නියාමනය සඳහා නිරීක්ෂණ විගණනය 2023.08.22 වන දින සිදු කිරීම සහ නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා වෘත්තීය සාමාජිකත්වය යාවත්කාලීන කර, ප්‍රමිති තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර වරලත් සැපයුම් හා ප්‍රවාහන සාමාජිකත්ව ආයතනය (Charted Institute of Logistics and Transporation Membership - CILT) සමඟ සම්බන්ධ වීම.

❖ නාවික ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය (CDC) ලබා දීම සඳහා 2023.07.24 දින පාඨමාලා ආරම්භ කර, 2023.11.22 වන දිනට පාඨමාලා නිමකර සහතික ප්‍රදානය කිරීම.

❖ ශ්‍රම බලකාය සඳහා ඵලදායි සහ කාර්යක්ෂම ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (Career Guidance Unit) 2023.08.29 දින ස්ථාපිත කිරීම.



❖ විශ්වවිද්‍යාලයීය සාගර විද්‍යා අංශය අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් අනාගත පරපුර වෙනුවෙන් පරිසර කථිකාවත සඳහා **"සාගර සහ දේශගුණික වෙනස්කම්"** පිළිබඳ මාර්ගගත ක්‍රමය මඟින් 2023.06.12 වන දින දේශන සංවිධානය කිරීම සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය සාගර විද්‍යා සංගමය ලෝක පරිසර දිනය සැමරීම සඳහා 2023.06.09 සහ 2023.06.10 දිනයන්හි පානදුර නගර සභාව සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් ශ්‍රී ලංකා කැස්බෑ සංරක්ෂණ ව්‍යාපෘතිය මඟින් සංවිධානය කරන ලද **"කඩොලාන සහ කැස්බෑ සංරක්ෂණය"** පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනට දායක වීම.

❖ ශ්‍රී ලංකාවේ තිරසාර සමුද්‍ර ජලජීවී වගා සංවර්ධනය සඳහා සැලැස්මක් සකස් කිරීම සඳහා වූ විෂය පථ අධ්‍යනයෙහි ව්‍යාපෘති හවුල්කරුවන්ගේ රැස්වීමක් 2023 මාර්තු මස 1 වන දින, සිඩ්නි විශ්වවිද්‍යාලයේ (UOS) ඔස්ට්‍රේලියානු ව්‍යාපෘති නියෝජිතයින් සමඟ පැවැත්වුණි. ව්‍යාපෘති හවුල්කරුවන් ලෙස බටහිර ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලය (UWA) සහ ඔස්ට්‍රේලියානු විදේශ කටයුතු සහ මහ කොමසාරිස් කාර්යාලය (AUSAID) ධීවර අමාත්‍යාංශය (MOF) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (OCUSL) ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) නියෝජිතයින්ද සහභාගී විය.





❖ 2023 වසර තුළදි විදේශීය සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා සහභාගි වීමට ධීවර හා සාගර විද්‍යා පීඨයට අයත් ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි අංශයේ ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් සඳහා අවස්ථා හිමිවීම. ඒ අනුව, 2023 මැයි මස 7 සිට 11 දින දක්වා පෘතුගාලයේ පැවැති (46th Larval Fish Conference in Lisban) සමුළුව සඳහා එම්.ඒ. ශලංක රංජුල සිසුවා සහභාගි වීම සහ ඩොලර් 1000 ක Grace Kelin – MacPhee Student Travel Award සම්මානය හිමි වීම, 2023 සැප්තැම්බර් 26-28 දිනයන් හී බංගලාදේශයේ ඩකා නුවර පැවති (Climate Action Champion Network Conference) සමුළුවට මල්ෂා සංදීපනි ගුණසිංහ ශිෂ්‍යාව සහභාගි වීම සහ 2023 ඔක්තොම්බර් 06 -08 වන දිනයන් හී ඉන්දුනීසියාවේ පැවති (Archipelago Island State Youth Conference 2023) සමුළුව සඳහා ඩී.එන්.තරුෂි නවරත්න දිසානායක සිසුවිය සහභාගි වීම.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්

සහයෝගී අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා නොට්ටේ ඩේම් විශ්වවිද්‍යාලය සහ දකුණු චීන මුහුදේ සාගර විද්‍යා ආයතනය,චීන විද්‍යා ඇකඩමිය සමඟ අවබෝධතා ගිවිසුම් (MOU) දෙක සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

05.1.2 වෘත්තීය තාක්ෂණ අංශය



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශය ප්‍රාදේශියව ස්ථාපිත මධ්‍යස්ථාන 08 කින් සමන්විත වේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කිරීම තුළ දසත විහිදුනු සිසු දරුදැරියන්ගේ වෘත්තීය අධ්‍යාපනය ඉහල නැංවීම සිදු කරනු ලැබේ.

05.1.2.1. 2023 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය තාක්ෂණ අංශ ප්‍රාදේශීය විද්‍යාල (08) පාඨමාලා ප්‍රගතිය

වගුව අංක 07: 2023 වසර තුළ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව :


අංශය	නිපුණතා සම්මත මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)/ ජාතික නොවන වෘත්තීය සුදුසුකම් (NNVQ)	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව				එකතුව
		පූර්ණකාලීන		අර්ධකාලීන		
		පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	
ධීවර හා ජලජීවී වගාව	NVQ	250	132	18	0	400
	NNVQ	502	20	24	20	566
සමුද්‍ර හා නාවික විද්‍යාව	NVQ	178	60	43	17	298
	NNVQ	157	29	30	0	216
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	NVQ	32	43	0	0	75
ජංගම පුහුණු	NNVQ	84	48	0	0	132
එකතුව		**1203**	**332**	**115**	**37**	**1687**

වගුව අංක **08: 2023.12.31** දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව:

ප්‍රාදේශීය මධ්‍යස්ථානය	පාඨමාලාව	නිපුණතා සම්මත මට්ටම **NVQ level**	පාඨමාලා සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව	**2023.12.31** දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව
මීගමුව	ඩිප්ලෝමා	5	3	95	**178**
	සහතික පත්‍ර	4&Non NVQ	6	83	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	-	-	
	ජංගම පුහුණු	-	-	-	
ත්‍රිකුණාමලය	ඩිප්ලෝමා	5	1	13	**45**
	සහතික පත්‍ර	4	2	32	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	-	-	
	ජංගම පුහුණු	-	-	-	
ගාල්ල	ඩිප්ලෝමා	6	1	34	**174**
		5	2	66	
	සහතික පත්‍ර	3/4	5	74	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	-	-	
	ජංගම පුහුණු	-	-	-	
තංගල්ල	ඩිප්ලෝමා	5	3	87	**196**
	සහතික පත්‍ර	3/4&Non NVQ	4	72	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	ISO	2	37	
	ජංගම පුහුණු	-	-	-	
යාපනය	ඩිප්ලෝමා	5	3	73	**147**
	සහතික පත්‍ර	4 Non NVQ	4	74	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	-	-	
	ජංගම පුහුණු	-.	-	-	
මට්ටක්කුලිය	ඩිප්ලෝමා	5	6	164	**260**
	සහතික පත්‍ර	4	2	51	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	2	45	
	ජංගම පුහුණු	-	-	-	
පානදුර	ඩිප්ලෝමා	5	8	251	**251**
	සහතික පත්‍ර	3 & 4	-	-	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-		-	
	ජංගම පුහුණු	-	-	-	
මඩකලපුව	ඩිප්ලෝමා	5	2	27	**77**
	සහතික පත්‍ර	3 & 4	3	50	
	අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC)	-	-	-	
	ජංගම පුහුණු	-	-	-	
2023.12.31දිනට අධ්‍යාපනය ලබමින් සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව					**1328**

වගුව අංක 09: 2023 වසර තුළ නිකුත් කරන ලද සහතික පත්‍ර සංඛ්‍යාව

නිපුණතා සම්මතයන්	නිකුත් කරන ලද සහතික පත්‍ර සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 දක්වා)
ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	643
ජාතික නොවන වෘත්තීය සුදුසුකම් (Non NVQ)	791
ජාත්‍යන්තර ප්‍රමිතිකරණ ආයතන සුදුසුකම් (ISO)	86
එකතුව	1520



05.1.2.2. ප්‍රගතිය



❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හී ඩිප්ලෝමාධාරී සිසුන් සඳහා දෙවන ඩිප්ලෝමා ප්‍රදානෝත්ස්වය 2023.10.31 වන දින නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රංග ශාලාවේදී පවත්වා ඩිප්ලෝමාධාරී 410 දෙනෙකු සඳහා ඩිප්ලෝමා ප්‍රදානය සිදු කිරීම.

❖ දකුණු කොරියාවේ සහ අනෙකුත් විදේශයන්හි නැව් තටාකාංගනයන් හී විද්‍යුත් වාප පෑස්සුම් (Flux – Cored Arc Welding Course) රැකියා අවස්ථා අයදුම් කිරීමට සුදුසු පුහුණු ශ්‍රමිකයින් බිහි කිරීම සඳහා මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් විද්‍යුත් වාප පෑස්සුම් පාඨමාලාව (FCAW) 2023.03.27 වන දින ආරම්භ කිරීම.

❖ ගාල්ල ප්‍රාදේශිය මධ්‍යස්ථානය මඟින් ප්‍රථම උසස් ඩිප්ලෝමා (NVQ Level 6) නාවික හා සැපයුම් කළමනාකරණ පාඨමාලාව 2023.08.06 දින ආරම්භ කිරීම.

❖ ප්‍රාදේශිය මධ්‍යස්ථාන (මට්ටක්කුලිය,ගාල්ල, මිගමුව) විසින් පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ ජීවිතාරක්ෂක, වාප්පු ලිපිකරු,ස්කූබා කිමිදුම්කරු, පාවෙන යාත්‍රා කාර්මික ශිල්පී (ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් - NVQ Level 04) ජලජීවී වගා කාර්මික පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් (NVQ) ලබාදීමේ කටයුතු සම්පාදනය කිරීම.

❖ රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක **"නිපුණතා සිසු සවිය"** ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහන සමඟ සම්බන්ධීකරණයෙන් වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම.

❖ තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක ජාතික ඩිප්ලෝමා ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමණාකරන (National Diploma in Aquaculture and Aquatic Resource Management) පාඨමාලා විෂය නිර්දේශ මොඩියුලයන් ආශ්‍රිතව ශිෂ්‍ය නවොත්පාදනයන් සහිත"Aqua Fiesta/ Innovation Hub" ප්‍රදර්ශනය 2023.10.30 වන දින පැවැත්වීම.



❖ තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ සිසුන් විසින් වසර තුළදී පිහිටුවා ගත් ඕෂන් වේව් (Ocean Wave) ශිෂ්‍ය සමාජයේ විෂය පරිබාහිර ක්‍රියාකාරකම් සහ සමාජ සත්කාරක වැඩසටහන් ලෙස වෙරළ පිරිසිදු කිරීම, ආහාර හා සනීපාරක්ෂක ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම සහ **"සිනා තොටක්"** ගීත විචාරාත්මක වැඩසටහන ප්‍රසිද්ධ ගේය පද රචක බන්දුල නානායක්කාරවසම් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම.

❖ පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමණාකරන සහ මුහුදු ආහාර තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා සිසුන් ක්ෂේත්‍ර චාරිකා සඳහා සහභාගි කරවීම.





❖ යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් **“தெல்லிபழை” (Thelipallai)** ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී මහජන දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.





❖ ක්‍රීඩා කෞශල්‍යයන් වර්ධනය කර ශාරීරික සුවතාවෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සමබර මනසකින් පරිපූර්ණ ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීම උදෙසා යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් විද්‍යාලයීය ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ සහභාගිත්වයෙන් 2023.08.10 දින ක්‍රීඩා උත්සවයක් සංවිධානය කර පැවැත්වීමට කටයුතු කිරීම.







05.2 විශ්වවිද්‍යාල සමාජීය වගකීම්

ප්‍රජා සහභාගීත්ව වැඩසටහන්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් 2023 වසර තුළදී සමාජ වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය උදෙසා ප්‍රජා මූලික සමාජ සත්කාරක වැඩසටහන් උසස් අධ්‍යයන අංශය සහ වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

❖ <u>උසස් අධ්‍යයන අංශය</u>

01. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ Nature Club විසින් සංවිධානය කරන ලද වාර්ෂික පරිසර දින **"EUTIERRA 23"** උත්සවයේ දී සාගර විද්‍යාව පිළිබඳ පාසල් සිසුන් සහ ගුරුවරුන් 500 ක් දැනුවත් කිරීමේ දේශනය ධීවර හා සාගර විද්‍යා පීඨයේ පීඨාධිපතිනි ආචාර්ය ලංකා වික්‍රමසිංහ මහත්මිය විසින් 2023 ජුනි මස 26 වන දින සිදු කිරීම.





02. විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු හා කළමණාකරන පීඨ ශිෂ්‍ය සංගම් නියෝජනය මඟින් සංවිධානය කරන ලද **"නැණුරළ 2023"** සිසුන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන **"අගලවත්ත සිරි පියරතන විද්‍යාලයීය"** අ.පොෂ. සා.පෙළ සිසුන් සඳහා 2023.05.17,18,19 යන දිනයන් තුළ පැවැත්වීම.





03. විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු හා කළමණාකරන පීඨ ශිෂ්‍ය සංගම් නියෝජනය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සිසුන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ අධ්‍යාපනික සම්මන්ත්‍රණය සහ උපදේශන වැඩසටහන **"අග්‍රම් 2023" (AGARAM -2023)** කොළඹ හින්දු විද්‍යාලයීය (මෝදර) අ.පො.ස. සා.පෙළ සිසුන් ඉලක්ක කර 2023.09.13 දිනය තුළ පැවැත්වීම.





04. පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් පානදුර වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2023.06.06 දින සිසුන් සහ කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් සිදු කිරීම.






05.3 විශ්වවිද්‍යාල පාලනය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2014 අංක 31 දරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ ධීවර,සාගර, සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර,සාගර, විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක,තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දෙස් විදෙස් පිළිගත් උසස් අධ්‍යාපන හා ප්‍රායෝගික දැනුමක් ලබා දී මානව සම්පත් බිහි කිරීමේ ජාතික වගකීම ඉටු කරනු ලබන්නේය.

උපකුලපති අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා හා පරිපාලක වන අතර සම්පූර්ණ සාමාන්‍ය පරිපාලනය පිළිබඳ ලේඛකාධිකාරී වගකීමෙන් කටයුතු කරන අතර, උසස් අධ්‍යයන අංශය පීඨාධිපතිවරුන් දෙදෙනෙකු මඟින් ද, වෘත්තීය තාක්ෂණ අංශය අධ්‍යක්ෂ පුහුණු මඟින් පාලනය සිදු කෙරේ. එසේම, පාලන මණ්ඩලය, ශාස්ත්‍රීය සභාව, පීඨ මණ්ඩල, මූල්‍ය කමිටුව, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීමේ සභාව සහ විගණන හා කළමනාකරණ කමිටුව මඟින් මූල්‍ය හා සියලු වත්කම් කාර්යක්ෂම හා ඵලදායිකත්වයකින් පරිපාලනය කෙරේ.

සියලු පාර්ශවකරුවන්ගේ එනම්, සේවාලාභී ශිෂ්‍ය ප්‍රජාවගේ, අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ, සැපයුම්කරුවන්ගේ,ගනුදෙනුකරුවන්ගේ සහ ප්‍රජාවගේ අවශ්‍යතා සමතුලිත වන පරිදි විශ්වවිද්‍යාල පාලනය තීරණ ගැනීම් සිදු කර කාර්යක්ෂමව හා ඵලදායි පාලනයක් සහතික කරයි.




නියාමනය සහ පාලනය	ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි	නීතීමය සහ නියාමන රාමුව
1. අභ්‍යන්තර විගණනය 2. අමාත්‍යාංශ විගණනය 3. ජාතික විගණන කාර්යාලය මඟින් සිදු කරනු ලබන විගණනය	1. අභ්‍යන්තර පාලන ක්‍රමවේද සහ ක්‍රියාවලි 2. පුරවැසි ප්‍රඥාප්තිය 3. අවධානම් කළමනාකරණ ක්‍රමවේද	1. 2014 අංක 31 දරන පාර්ලිමේන්තු පනත 2. ආයතන සංග්‍රහය 3. මුදල් රෙගුලාසි 4. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5. රාජ්‍ය චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම. 6. පාලන මණ්ඩල තීරණ

01. වගවීම

ජල ගාස්තු	3,437,541	1,723,597
කුලී සහ දේශීය බදු	42,284,965	33,569,152
වෙනත්	66,240	100,361
නීති ගාස්තු හා වෙනත් දීමනා	640,553	-
සනීපාරක්ෂක සේවය	13,243,094	9,834,539
ආරක්ෂක වියදම්	17,170,771	15,249,083
උපදේශනය	78,733	-
කාර්ය මණ්ඩල පුහුණු සහ වෘත්තීය සංවර්ධනය	15,000	-
විගණන ගාස්තු	-	1,405,000
ස්ථාවර වත්කම් ලේඛණය (FAR)	-	3,540,626
	102,729,117	**84,614,602**

සටහන් අංක (17)

පුහුණු වියදම් සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වියදම

පුහුණු ද්‍රව්‍ය	849,752	10,023
උසස් අධ්‍යයන අංශය සඳහා වූ වියදම්	4,779,362	10,399,084
විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ සංසද රැස්වීම් වියදම	100,000	-
වෘත්තීය තාක්ෂණ අංශය සඳහා වූ වියදම්	6,323,936	6,787,747
නාවික සැපයුම් කළමනාකරණ ඩිප්ලෝමාව (මාර්ගගත)	163,760	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 01	430,646	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 02	384,275	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 03	388,275	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 04	394,010	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 05	366,779	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 06	372,142	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම්	675,917	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම්	441,713	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම්	387,150	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 10	504,434	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 13	266,184	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 12	1,676,458	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 14	137,900	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 15	137,900	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 16	137,900	-
විදාවුත් චාප පෑස්සුම් පාඨමාලා (FCAW) - වියදම් 17	109,100	-
පශ්චාත් උපාධි පාඨමාලා ගාස්තු	107,400	-
ධීවර යාත්‍රා නියමු පාඨමාලා පුහුණු වියදම්	570,220	872,260
සම්මන්ත්‍රණය සඳහා වියදම් - Symposium	295,785	-
ජංගම පුහුණු පාඨමාලා වියදම්	141,675	169,050
අභියෝග්‍යතා පරීක්ෂණ වියදම්	1,324,297	1,487,259

උපාධි ප්‍රදානෝත්සව වියදම්	2,850,875	6,428,070
ක්ෂේත්‍ර චාරිකා (Offshore)	14,000	-
පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය (CPGS)	625,398	-
ජලජීවී වගා මුහුදු ආහාර තාක්ෂණය	1,121,281	-
සැපයුම් දාම කළමනාකරණ උපාධිය	1,720,898	-
සැපයුම් දාම කළමනාකරණ උපාධිය	36,000	-
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය	20,570	-
පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය (CPGS) - වියදම	334,040	-
නාවික සැපයුම් කළමනාකරණ ඩිප්ලෝමාව (මාර්ගගත) මීගමුව	101,025	-
නිපුණතා සවිය ගෙවීම්	623,000	-
ධාරිතා සංවර්ධනය	-	771,101
සම්මන්ත්‍රණ සඳහා වියදම්	-	304,832
	28,914,055	**27,229,426**

සටහන් අංක (18)

වෙනත් වියදම්

විනෝදාස්වාදය	2,443,203	1,583,541
සුභසාධනය	2,509,538	837,066
ප්‍රවාහනය - නාරා	1,121,744	769,725
බැංකු ගාස්තු	40,125	8,350
පාලන මණ්ඩල රැස්වීම් වියදම්	1,605,560	517,557
ප්‍රචාරණය සහ මුද්‍රණ	63,950	-
සාමාජිකත්වය ලබාගැනීමේ වියදම්	7,500	315,479
විගණන වියදම්	-	-
මාධ්‍ය වියදම්	4,352,896	3,189,847
නීති ගාස්තු	789,811	566,843
වියදම් මත ලියා හැරීම	-	225,500
උපදේශන ගාස්තු	-	449,316
	12,934,327	**8,463,224**

සටහන-19

විලම්භිත ආදායම

විස්තරය	සැපයුම් දාම කළමනාකරණ උපාධිය 2023/2024	ජලජීවී වගා මුහුදු ආහාර තාක්ෂණය 2023/2024	ධීවර යාත්‍රා නියමු පාඨමාලාව	විද්‍යුත් වාප පැස්සුම් පාඨමාලාව (FCAW)	නාවික සැපයුම් කළමනාකරණ ඩිප්ලෝමාව (මාර්ගගත) මීගමුව	පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය (CPGS)	උසස් ජාතික ඩිප්ලෝමාව/ නාවික සැපයුම් (HND/MLM) - පාඨමාලා ආදායම් - ගාල්ල)	එකතුව
ඉදිරියට ගෙන ආ ශේෂය								
සමාලෝචිත වර්ෂයේ ආදායම	8,197,500	8,099,000	1,390,000	10,049,350	1,638,300	3,773,321	325,500	33,472,971
සමාලෝචිත වර්ෂයේ වියදම	1,756,898	1,121,281	570,220	6,810,781	101,025	1,066,838		11,427,043
ඉදිරියට ගෙන ගිය ශේෂය	**6,440,602**	**6,977,719**	**819,780**	**3,238,569**	**1,537,275**	**2,706,483**	**325,500**	**22,045,928**

සටහන 20			
2023.12.31 දිනට පවත්නා අරමුදල් ප්‍රමාණ			
	ලැබීම්	**වියදම**	**2023.12.31 දිනට ශේෂය**
ප්‍රාග්ධන	46,050,000	31,799,895.00	14,250,105.00
විශේෂ ව්‍යාපෘති	5,143,623	2,124,594.00	3,019,029.27
කොරියානු රජයේ ප්‍රදාන - KOICA	6,758,370	6,758,370.00	-
ආංශික සංවර්ධන වැඩසටහන - (SSDP)	3,637,259	3,637,259.00	-
AHEAD ව්‍යාපෘති ප්‍රදාන	4,693,416	4,693,416.00	-
නිපුණතා සවිය	6,632,000	623,000.00	6,009,000.00
එකතුව	**72,914,668.27**	**49,636,534.00**	**23,278,134.27**

සටහන් අංක (21)		
ගෙවිය යුතු දෑ		
රදවාගැනීම්	3,016,587	7,569,134
නැවත ගෙවිය යුතු -පුස්තකාල තැන්පතු	2,674,000	2,681,000
නැවත ගෙවිය යුතු -විද්‍යාගාර තැන්පතු	1,708,000	1,707,000
මුද්දර ගාස්තු	159,421	199,361
උපයන විට ගෙවීම්	156,925	81,013
නැවත ගෙවිය යුතු තැන්පතු	239,080	182,080
විගණන ගාස්තු	1,703,100	1,020,000
ණය හිමියන්ට ගෙවීම්	1,797,495	840,688
පානදුර ගොඩනැගිල්ල	-	-
මට්ටක්කුලිය වැඩහල	-	-
නැවත ගෙවිය යුත තැන්පතු	290,826	285,826
නැවත ගෙවිය යුතු පර්යේෂණ අධ්‍යයන	450,729	154,961
සුභසාධනය NIFNE	10,000	-
රැඳවුම් බදු	1,506,325	-
වැටුප් අත්තිකාරම්	137,596	-
හඳුනා නොගත් ආදායම	859,430	
	14,709,513	**14,721,063**

09. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/E/OUSL/FA/2023/17

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 ජූලි 25 දින

VICE CHANCELLOR'S OFFICE
31 JUL 2024
OCEAN UNIVERSITY OF SRI LANKA

උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 31 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. VOT/E/OUSL/FA/2023/17 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 ජූලි 25 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 20 - 30 | +94 11 2 88 70 33 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මනය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ රු.53,263,671ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ආදායම් ලෙස ගලපා තිබියදී හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ නැවතත් අදාල ප්‍රාග්ධන ප්‍රදාන හා පරිත්‍යාග යටතේ ගලපා, සමුච්චිත අතිරික්තයෙන් එම අගය ඉවත්කර තිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් නිවැරදිව දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් රු.2,088,390 ක් ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගෙවිය යුතු ගිණුම් යටතේ හඳුනා නොගත් ආදායම් ලෙස දක්වා තිබූ රු.859,430 කට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පාඨමාලා 5 කට අදාලව ලැබිය යුතු පාඨමාලා ගාස්තුව රු.965,005 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.1,286,158 ක් වුයෙන්, රු.321,153 ක නොසැසඳීමක් පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.23,278,137 ක් වූ වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය ස්කන්ධය යටතේ දැක්වීම වෙනුවට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඊ) 2022 වර්ෂයට අදාල රු.361,956 ක වියදම් සාමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන ලැබීම් රු.66,156,298 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල එම අගය රු.46,460,299 ක් ලෙස දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන

· වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගත්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල විෂයය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124(2)	ආදායම් උත්පාදන ඒකකයක් ලෙස ක්‍රියාත්මක දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය පිහිටුවීම සම්බන්ධයෙන් හා කාර්ය මණ්ඩල දිමනා ගෙවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය	
(i)	මුදල් රෙගුලාසි 371(2) (ආ)	විධිමත් අනුමැතියකින් තොරව උපරිම අත්තිකාරම් සීමාව ඉක්මවා අවස්ථා 13 ක දී රු.106,000 සිට රු.674,800 දක්වා පරාසයක අත්තිකාරම් ලබා දී තිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 371(5)	වර්ෂය තුළ ලබා දෙන ලද අත්තිකාරම් දෙසැම්බර් 31 දිනට පියවීමට කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 25 ක දී ලබා දී තිබූ රු.1,893,476 ක අත්තිකාරම් පියවා නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 756 (6)	2019 වර්ෂයේ සිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
(i)	XIX පරිච්ඡේදයේ 5.3.1,5.5.1 වගන්ති	මඩටක්කුලිය, ත්‍රිකුණාමලය සහ තංගල්ල රජයේ නිවාසවල පදිංචිව සිටි නිලධාරීන් 07 දෙනෙකුගෙන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ මැයි දක්වා අය විය යුතු එකතුව රු.1,808,783 ක් වූ නිවාස කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි.
(ii)	XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය	විශ්වවිද්‍යාලයට අයත් රජයේ නිල නිවාසවල ජලය , විදුලි බිල්පත් ආයතනය විසින් ගෙවා තිබූ අතර මඩටක්කුලිය, ත්‍රිකුණාමලය , තංගල්ල නිවාස වල පදිංචි අය සඳහා 2022 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ මැයි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු.438,834 ක ජල හා විදුලි බිල්පත් ගෙවා තිබුණි.

(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(1) වගන්තිය	දින 29 න් දින 144 ත් අතර කාල ප්‍රමාදයකින් පසු සේවකයින් 05 දෙනෙකුට රු.4,744,924 ක පාරිතෝෂික ගෙවා තිබුණි.
(ඉ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද වක්‍රලේඛ ලිපියේ 5 වන ඡේදය.	බැදුම්කර කඩකරන ලද ආචාර්යවරු දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.2,876,769 ක මුදල් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.
(ඊ)	1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛයේ 1.3.1 (III) ඡේදය	කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් හිමි විධායක නිලධාරීන් හතරදෙනෙකු වෙත 2022 ජනවාරි සිට සමාලෝචිත වර්ෂයේ මැයි දක්වා කාලපරිච්ඡේදයට අදාලව ප්‍රවාහන වියදම් ලෙස එකතුව රු.375,803 ක් ප්‍රතිපූරණය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2023 මාර්තු ආරම්භ කර තිබූ FLAX CORD ARK WELDING පාඨමාලාවේ උපදේශක සඳහා ඇණිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථකර ගැනීමකින් තොරව පැය 522 ක් සඳහා රු.522,000 ක් ගෙවා තිබුණි.

(ආ) 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 66 වගන්තියෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අදාල කර නොගත යුතු බව දක්වා තිබුණද විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති ජාතික විශ්වවිද්‍යාල සඳහා අනුමත තනතුරු හා වැටුප් පරිමාණයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන තිබුණි. එසේම යෝග්‍යතා පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම, දුරස්ථ අධ්‍යාපන ඒකකය පිහිටුවීම හා බාහිර

දේශක දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ පදනම් කරගෙන නිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී අමාත්‍යාංශය මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලබා දෙන ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.3,019,030 ක් අදාල අරමුණු සඳහා යොදා නොගෙන නිසි අනුමැතියකින් තොරව ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබුණි.

(ඈ) වෘත්තීය ප්‍රහුණුවේ යෙදෙන ආර්ථික දුෂ්කරතා ඇති සිසුන් සඳහා අමාත්‍යාංශය විසින් ලබා දෙනු ලබන නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වැඩසටහන මගින් 2023 ජූනි මාසයේදී සිසුන් 418 දෙනෙක් සඳහා රු.6,632,000 ක් ලබා දී තිබුණ අතර ඉන් සිසුන් 178 දෙනෙකුට රු.623,000 ක් පමණක් ගෙවා තිබුණි. ඉතිරි වූ රු.6,009,000 ක මුදල අදාල අරමුණු සඳහා යොදා නොගෙන ජංගම ගිණුමකට බැර කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නිෂ්කාර්යව රඳවා තිබුණි.

ඩබ්ලිව්.ඒ.සී.වික්‍රමරත්න
විගණකාධිපති

10. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
இலங்கை சமுத்திர பல்கலைக்கழகம்
Ocean University of Sri Lanka
Office of the Vice Chancellor
කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15. காக்கைதீவு, மட்டக்குளிய, கொழும்பு 15. Crow Island, Mattakkuliya, Colombo 15.

මාගේ අංකය. / எனது எண். / My No.	OCU/05/02/36/2023/17(i)	ඔබේ අංකය. / உங்களது எண். / Your No.	VOT/E/OUSL/2023/17	දිනය. / திகதி. / Date.	2024.08.13

ඩබ්.එම්.පී.ඒ. මොන්සේකා මිය,
අ යෝජ්‍ය විගණකාධිපති,
ාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

ඉහත කරුණට යොමුව ඔබගේ සමාංක 2024.07.25 දිනැති විගණකාධිපති වාර්තාව සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඊට අදාළ ප්‍රගතිය සඳහන් කරමින් සකස් කරන ලද වාර්තාව මේ සමඟ එවමි.

මහාචාර්ය වසන්ත රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15.

මහාචාර්ය වසන්ත රත්නායක PhD,
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

පිටපත් :
01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

Vice Chancellor : Tel (Office) +94 (0) 11 7112650 Fax : +94 (0)11 2525102 E-mail : vc@ocu.ac.lk Website: www.ocu.ac.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

(අ) විගණිත කරුණ සමඟ එකඟ වන අතර 2024 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ දී විගණන නිරීක්ෂණය පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ආ) දීප ව්‍යාප්තව විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන පිහිටීම නිසා, නිසි ආකාරයෙන් භාණ්ඩ ඇනවුම් පරිදි මධ්‍යස්ථාන වෙත භාණ්ඩ ලබාගෙන ගෙවීම් කිරීමට අදාළ ඉන්වොයිස්පත්, භාණ්ඩ ලැබීමේ සහතික යනාදිය සම්පූර්ණකර තැපැල් මාර්ගයෙන් එම තොරතුරු ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත්කිරීමේ දී සිදුව ඇති ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් මෙම තත්ත්වය වාර්තා වී ඇත කෙසේ වෙතත් ඉදිරියේ දී මෙම තත්ත්වය අවමකිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) අදාළ වටිනාකමින් රු 620,750/- ක ශේෂය 2023 වර්ෂයේ දී FCAW පැස්සුම් පාඨමාලාවෙන් ලද ආදායම් බව මේ වන විට හඳුනාගෙන 2024 අවසන් ගිණුම් තුළින් ජර්නල් සටහන් අංක 69 මඟින් නිවැරදිකර ඇත. ඉතිරි මුදල් ද ඉදිරියේ දී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. විශ්වවිද්‍යාලය වෙත ලැබෙන සෘජු තැන්පතු පැහැදිලිව හඳුනාගත නොහැකි අවස්ථාවලදී කටයුතු කරන ආකාරය ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ ද දක්වා ඇත.

(ඈ) විගණිත කරුණ සමඟ එකඟව 2024 වර්ෂයේ අවසන් ගිණුම් තුළින් ජර්නල් සටහන් අංක 67 මඟින් නිවැරදිකර ඔබ වෙත ඉදිරිපත් කර ඇත.

(ඉ) අදාළ ගැලපීම රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 11 හි නුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම හඳුනා ගැනීමට ප්‍රමිතයේ රාජ්‍ය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් යටතේ IG.53 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය(Statement of Financial Performance) ඉදිරිපත් කිරීම සඳහා ලබාදී ඇති නිර්දේශයේ සටහන් අංක 10 (Note 10) මඟින් පෙන්වා දී ඇති නිර්දේශයට අනුව අදාළ ගැලපීම් සිදුකර ඇත.

(ඊ) විගණිත කරුණ හා එකඟ වන අතර ඉදිරියේ දී මෙවන් තත්ත්වයන් අවමකරවා ගැනීමට උපදෙස් ලබා දී ඇත.

(උ) ඉහත (ඉ) හි පිළිතුර අදාළ වන අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ නිර්දේශනයට අනුව අදාළ ගැලපීම් සිදුකර ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අදාළ ශේෂය දක්වා ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.2

(ආ)

(i) අංක 01/2020 සහ අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය සම්බන්ධව පූර්ණ අවබෝධයෙන් යුක්තව විශ්වවිද්‍යාලය කටයුතු කළද වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය යටතේ විශ්වවිද්‍යාලය විසින් සැළසුම් කරන ලද වැඩසටහන් තුළවූ පිරිවැය ඉහළ යෑම හේතුවෙන් එකී වැඩසටහන් සාර්ථකව පවත්වාගෙන යෑමේ දී සිදුවූ ප්‍රායෝගික ගැටලු සම්බන්ධව අවධානය යොමුකර අදාළ අත්තිකාරම් ලබා දී ඇත. මෙයින් එක් අවස්ථාවක දී හැර අනෙකුත් සෑම අවස්ථාවක දී ම ලබා දී ඇති උපරිම අත්තිකාරම් මුදල 162,500/- වේ.
එසේම රු674,800/- මුදල උපාධි ප්‍රධාන උත්සවය සඳහා නෙළුම් පොකුණ ශාලාව වෙන්කර ගැනීමේ දී ඔවුන් විසින් අයකරන සම්පූර්ණ මුදල ගෙවා අවසන් වන තෙක් ඔවුන් විසින් ඉන්වොයිසියක් ලබා නොදෙන බැවින් (සේවය ලබාගැනීමට ප්‍රථම සම්පූර්ණ මුදලම ගෙවියයුතු කොන්දේසිය යටතේ) නාම මාත්‍ර ඉන්වොයිසියක් ලබාගෙන විභාග කටයුතු සම්බන්ධව කටයුතු කරන ලද විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ නිළධාරියකු ගේ භාරයේ අදාල ගෙවීම් අත්තිකාරමක් ලෙස ගෙවීම් කර ඇත්තේ සාමාන්‍ය රීති සම්ප්‍රදාය

යටතේ ගෙවීමක් සම්පූර්ණ වීමට අවශ්‍ය සාධක සම්පූර්ණ නොවන හේතුවනි මන්ද යත් නාම මාත්‍රික ඉන්වොයිස් මත ගෙවීම් සිදුකළේ නම් එයද විමසුමට ලක්වීමට හැකි කරුණක් වීම සම්බන්ධව අවධානය යොමුකිරීමෙන් අනතුරුව වේ. ඒ අනුව නිකුත් කරන අත්තිකාරමට අදාළ ගෙවීම් සිදුකර අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි සමඟ අත්තිකාරම් පියවීමත් සමඟ එහි පියවීම සටහන් කරගැනීමේ ගිණුම්කරණ ක්‍රමවේදය යටතේ වේ. කෙසේ වෙතත් මෙම ගෙවීම් සෘජුව වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළේ නම් අසම්පූර්ණ වවුචර් පත්‍රයක් පදනම් ව කළ ගෙවීමක් ලෙස ද සටහන්කිරීමට අවස්ථාවක් තිබූ බවද පෙන්වා දීමට කැමැත්තෙමු. ඒ අනුව මෙකී තොරතුරු වලට යටත්ව විගණිත කරුණ සම්බන්ධව එකඟ වන අතර ඉදිරියේදී මෙම තත්ත්වයන් වළක්වාගැනීමට කටයුතු කරනු ලැබේ.

(ii) මුදල් රෙගුලාසි 371(5) හි වූ විධිවිධාන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.

(iii) 2022 වර්ෂයට අදාළව සිදුකරන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කටයුතු අවසන් අදිරයේ ඇතිබැවින් එම සමීක්ෂණ කටයුතු අවසන් වූ වහාම 2023 හා 2024 අදාළ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ඇ)

(i) ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ I වැනි ඡේදයට අනුව "රජයේ නිවාස' යන්නට පහත පරිදි රාජය සතු ගොඩනැඟිලි අයත්වේ.

I. රජයට සුදුස්සක් කල හැකි ගොඩනැඟිලි.
II. පදිංචිය සඳහා වෙන්කර දෙන ලබන ගොඩනැඟිලි.

පදිංචිය සඳහා වෙන්කර දෙනු ලබන ගොඩනැඟිලි සම්බන්ධව ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 4 වැනි වගන්තිය අනුව වෙන්කර දී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5 වැනි වගන්තිය අනුව මුදල් අයකර යුතුව ඇති වුවත්, විගණනය විසින් පදිංචිය සඳහා වෙන්කර ඇති ගොඩනැඟිලි ලෙස නිරීක්ෂණ නගා ඇති ගොඩනැඟිලි ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් පහත දක්වා ඇති හේතු මත පදිංචිය සඳහා වෙන්කර දී ඇති ගොඩනැඟිලි ලෙස හඳුනාගෙන නොමැත.

- මෙම ගොඩනැඟිලි අතරින් මට්ටක්කුලිය භූමියේ පිහිටා ඇති ගොඩනැඟිලි දෙක KOIKA ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම සිදුකිරීමට සැලසුම් කර ඇති භූමියේ පිහිටා තිබීම නිසා එම ගොඩනැඟිලි දීර්ඝ කාලීන නඩත්තු නොකිරීම මත පදිංචිය සඳහා වෙන්කර දිය හැකි තත්ත්වයක නොතිබීම. පහත සඳහන් ආයතන අවශ්‍යතාවයන් සඳහා විගණන විමසුම මඟින් නිරීක්ෂණ නගා ඇති ගොඩනැඟිලි අවශ්‍ය වීම.
- රියදුරන් හා නඩත්තු අංශයේ අත්‍යවශ්‍ය රාජකාරීන් පවරා ඇති කාර්ය මණ්ඩලයේ රාජකාරී අවශ්‍යතාව මත ආයතනය තුළ රඳවා ගැනීමට අවශ්‍ය වන බැවින් ඔවුන්ට නවතැන් හා විවේක ගැනීම සඳහා.
- අධ්‍යයන හා අනධ්‍යයන අංශයේ කාර්ය මණ්ඩලවල සේවකයන් ආයතනයේ අවශ්‍යතාවය මත රඳවාගැනීමට අවශ්‍ය වන අවස්ථාවලදී එම සේවකයන් හට නවතැන් හා විවේක ගැනීම සඳහා.
- රාත්‍රී කාලයේදී ආයතනයේ පරිපාලනමය සහ හදිසි අවස්ථාවලදී රජකරිය යොදා ගැනීමට ආයතනය තුළ යම් කිසි නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය වූ විට එම නිලධාරීන්ට රාත්‍රී කාලයේදී නවාතැන් ගැනීම සඳහා.
- එසේම අප විශ්වවිද්‍යාලය මට්ටක්කුලිය කාකදූපත ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන කාර්යාලය ඇතුළුව විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 කින් සමන්විත වේ. ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශිය කාර්යාල වල සේවයේ නියුතු සේවකයන් හට විවිධ රාජකාරී අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙම ආයතන වෙත යාමට සිදුවනු ඇත .එවැනි අවස්ථාවල එම නිළධාරීන් සඳහා නවාතැන් පහසුකම් අවශ්‍ය වීම.

ඉහත කරුණු මත විගණනයේ නිරීක්ෂණය කර ඇති පරිදි මෙම ගොඩනැඟිලි ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 01 වැනි වන්තිය අනුව පදිංචිය සඳහා වෙන්කරනු ලබන නිවාස ලෙස හඳුාගෙන නොමැත, ඒම නිසා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 04 වන වගන්තිය අනුව අදාළ ගොඩනැඟිලි වෙන්කර දී

නොමැත. එවන් තත්ත්වයක් තුළදී විගණනයේ නිරීක්ෂණය කර ඇති පරිදි ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 වැනි වගන්තිය අනුව කුලි මුදල් අයකිරීමට නොහැකි බව පෙන්වා දෙමි.

(ii) විගණනයන් නිරීක්ෂණය කර ඇති පරිධි කාර්ය මණ්ඩලයේ යම් කිසි පිරිසක් ආයතනයේ අවශ්‍යතාවය සඳහා සහ ඇතැම් විට ඔවුන්ගේ අවශ්‍යතාවය මත ගොඩනැඟිලි කිහිපයක නේවාසිකව සිටීම හේතුවෙන් ජල හා විදුලි බිල්පත් ලෙස අමතර පිරිවැයක් ආයතනයට දැරීමට සිදුවී ඇත. මෙම සේවකයන් ආයතනයේ අවශ්‍යතාවය සඳහා සහ ඇතැම් විට ඔවුන්ගේ අවශ්‍යතාවය හේතුවෙන් නේවාසිකව සිටීම නිසා එම ගොඩනැඟිලි වෙනුවෙන් ආයතනය දරණ ලද ජල හා විදුලි බිල්පත් ලෙස වියදම් වී ඇති මුදල පහත පරිදි අයකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

හඳුනාගත හැකි මුළු විදුලිය හා ජල බිල්පත් පදිංචිව සිටි අයවලුන් අතරේ සමසේ බෙදා එම මුදලින් රියදුරන් හා කම්කරුවන්ගෙන් 25% මුදලක් ද අනෙකුත් අයගෙන් 50% මුදලක් අයකර ගැනීම.
ඉදිරියේදී මෙම ගොඩනැඟිලි තවදුරටත් යොදාගත යුතු ආකාරය පිළිබඳ පරීක්ෂා කර බලා නිර්දේශ ලබා ගැනීම සඳහා මණ්ඩලයක් පත්කර එම මණ්ඩලයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

(ඇ) 2023 වර්ෂයේ සේවක පාරිතෝෂක මුදල් ගෙවීමේදී නිමිත කාල පරාසය ඉක්මවා ගෙවීම් සිදු කර ඇති සේවකයන් අතරින් කිහිපදෙනෙකු හදිසියේ මිය ගිය සේවකයන් වන අතර එම සේවකයන්ගේ පාරිතෝෂික මුදල් ඔවුන්ගේ යැපෙන්නන් වෙත ගෙවීමේදී අවශ්‍ය නිවැරදි ලිපි ලේඛන හා ඒවා තහවුරු කර ගැනීම් සිදු කිරීමේදී යම් ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඒසේම අදාළ ගෙවීම් සිදුකිරීම සඳහා අයතනයේ මුදල් ප්‍රමාණවත් නොවීම ද මෙම ගෙවීම් ප්‍රමාද වීමට හේතුවී තිබේ.

(ඉ) විගණිත කරුණ සමඟ එකඟවන අතර විශ්වවිද්‍යාලයෙන් අධ්‍යයන නිවාඩු ලබාගත් අධ්‍යාපනවේදීන් විසින් බැඳුම්කර සහ ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් අයකර ගත් මුදල් ප්‍රතිලාභ ලැබෙන ආයෝජන සඳහා භාවිතාකිරීම සම්බන්ධයෙන් විගණිත කරුණ ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභාව විසින් 1998.08.18 දින නිකුත් කරණ ලද වක්‍රෙල්ඛ අංක 737 සහ 2002.07.10 දිනෙන් නිකුත් කර ඇති වක්‍රෙල්ඛ අංක 805 හි අන්තර්ගතය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට ගැලපෙන පරිදි භාවිතාකිරීම සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය කමිටුව වෙත පත්‍රිකාවක් ඉදිරිපත්කර එම කමිටුවේ නිර්දේශ සහිතව විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයට 2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 20 වගන්තියේ (ත) ප්‍රකාරව ලබා දී ඇති බලතල අනුව විශ්වවිද්‍යාලයේ ඉදිරිකටයුතු සඳහා භාවිතා කිරීම සඳහා යොදාගැනීමට පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමත කරවාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඊ). මෙම ගෙවීම් මෙවන විට නතර කර ඇති අතර 2022 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ පැවති රියදුරු පුරප්පාඩු, අළුත්වැඩියා කරන ලද ගරාජ වලින් ලබා ගැනීමට නොහැකිවීම යනාදි කරුණු හේතුවෙන් මෙම සේවා ව ලබා ගැනීම සඳහා ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට සිදුවිය.

2.3 වෙනත් කරුණු.

(අ) මෙම උපදේශක සඳහා රාජකාරී වේලාවෙන් බැහැර කාලයක් සඳහා වූ පැය ගණන් පාදකව ගෙවීම් කරන ලදි.

(ආ) විවෘත හා දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳව 2022.12.29 දිනැති ලිපියක් මගින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ලිපියක් ඉදිරිපත් කර ඇත.එමගින් මේ පිළිබඳව උපදෙස් ඉල්ලා ඇත. කෙසේ වෙතත් පාලන මණ්ඩලය සඳහා ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු සහභාගීවන බැවින් විවෘත හා දුරස්ථ මධ්‍යස්ථානය සම්බන්ධ තීරණ ගැනීමේදී රාජකාරීමය වශයෙන් අමාත්‍යාංශය සම්බන්ධ වේ.ඉදිරියේදී දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානයේ සියලු ගෙවීම් සඳහා මූල්‍ය මණ්ඩලයට සහ පාලක මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතින් ලබා ගැනීමට කටයුතු කෙරේ.

(ඇ) විගණිත කරුණ සමඟ එකඟ නොවේ. රු.3,019,030/- ක වටිනාකම ගොඩනැඟිලි ඉදිකිරීමේ දී ඉදිකිරීම් කරුවන්ගේ බිල්පත් විටිනාකමින් සිදුකරන රදවාගැනීම් මුදල් වේ. අදාළ රදවාගැනීම් නිශ්චිත කාලසීමාවක් සඳහා සිදුකරන අතර අදාල කාල සීමාව අවසානයේ උපදේශන සේවා සපයන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සිදුකරන සහතික කිරීම මත ඉදිරියේ දී අදාළ නිදහස් කිරීම් සිදුකරනු ඇත. අදාල ඉදිකිරීමට අදාළ අවසාන බිල්පත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් රේඛීය අමාත්‍යාංශය වෙත රදවාගැනීම් නිදහස් කිරීම ඇතුළත්ව සම්පූර්ණ ප්‍රතිපාදනය විශ්වවිද්‍යාලය වෙත නිදහස්කර ඇති අතර. රදවාගැනීම් ප්‍රමාණය හැර අනෙකුත් ගෙවීම් සිදුකර රදවාගැනීම් ප්‍රමාණය නිදහස් කිරීමට නියමිත කාලසීමාව වන තෙක් අරමුදල් සුදුසු පරිදී ආදායමක් ලැබෙන ප්‍රභවයක අයෝජනය කිරීම සඳහා කටයුතුකර තිබේ. ඒ අනුව විශ්වවිද්‍යාලය වෙත මෙම අරමුදල් ආයෝජනයෙන් රු.516,882/- මුදලක් ස්ථාවර තැන්පතු පොලී අදායම් ලෙස සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබේ.

(ඈ) ආර්ථික දුෂ්කරතා ඇති වෘත්තිය පුහුණුවේ යෙදෙන සිසුන් සඳහා ලබා දෙන ශිෂ්‍යාධාර වැඩසටහන සඳහා ගෙවීම්කිරීම සඳහා අරමුදල් වෙන්කර විශ්වවිද්‍යාලය වෙත යොමුකර තිබුණ ද එම ගෙවීම් ලාභීන් වෙත ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වවුචර්පත් සඳහා නිසි ලෙස ගෙවීම් සිදුකර තිබුණි. 2024 වර්ෂයේ පෙබරවාරී මස ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර තිබූ ආර්ථික දුෂ්කරතා ඇති වෘත්තිය පුහුණුවේ යෙදෙන සිසුන් 116 දෙනෙක් වුවෙන් රු . 1,938,000.00 ගෙවීම් සිදුකර ඇත . ඒ අනුව ශිෂයාධාර ගෙවීම් සිදුකිරීමට ලබා දී ඇති මුදලින් එකතුව රු 2,651,000.00 ක මුදලක් ගෙවීම් සිදුකර ඇති ඇති අතර ඉතිරි 4,071,000.00 මුදල ශිෂ්‍යාධාර හිමි සිසු සිසුවියන් සොයා බලා කඩිනමින් ගෙවීම් කිරීමටත් එසේත් නොමැතිනම් අතිරික්ත අරමුදල් නැවත රේඛීය අමාත්‍යාංශය වෙත අරමුදල් යොමුකිරීමට උපදෙස් ලබා දී ඇත.

****


11. මූල්‍ය විග්‍රහය - 2013 – 2022 වසර 10 ක කාලසීමාව

මෙහෙයුම් ආදායම	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
රජයේ ප්‍රදාන හා පුනරාවර්තන වියදම්	87,073,000	105,000,000	139,000,000	175,000,000	247,161,000	309,048,000	325,340,000	377,767,500	375,333,000	404,580,000
ආංශික සංවර්ධන වැඩසටහන SSDP-පුනරාවර්තන ප්‍රදාන		3,203,725	3,689,750	9,115,566	17,775,769	5,260,073	4,177,597	6,365,418	1,187,393	
වෙනත් ආදායම්	33,294,557	41,104,699	49,440,512	22,260,644	4,753,879	11,575,725	4,617,034	11,503,957	28,159,493	29,250,010
රජයේ ප්‍රදාන - පුනරුත්ථාපන සහ වෙනත්									2,884,115	
විලම්බිත ආදායම් සඳහා ක්‍රමක්ෂය ගැළපීම්					47,915,337	59,520,683	71,119,936	66,254,496	89,532,996	91,763,105
මුළු ආදායම	120,367,557	149,308,424	192,130,261	206,376,210	317,605,985	385,404,481	405,254,567	461,891,371	497,096,997	525,593,115
මුළු වියදම	190,707,435	220,321,478	239,488,741	288,327,985	295,837,203	390,421,024	457,004,082	465,955,244	497,670,776	570,307,086
වසර සඳහා අතිරික්තය/ඌණතාවය	(70,339,878)	(71,013,054)	(47,358,479)	(81,951,775)	21,768,782	(5,016,543)	(51,749,515)	(4,063,873)	(573,779)	(44,713,971)
ප්‍රාග්ධන නොවන වත්කම්										
දේපළ, පිරියත සහ උපකරණ	226,344,031.47	413,101,215	434,871,745	437,451,967	525,409,154	592,759,143	648,761,979	682,851,212	628,033,936	2,197,272,747
නොනිමි වැඩ - ගොඩනැගිලි										61,855,799
අස්පෘශ්‍ය වත්කම්										7,460,979
ස්ථාවර කැන්පතු							4,593,819	5,065,976	11,658,355	12,291,974
ප්‍රාග්ධන වත්කම්										
කාර්ය මණ්ඩල ණය	11,133,181.78	7,299,959	6,456,621	8,507,849	12,008,231	12,540,685	13,167,510	15,195,354	12,627,161	13,189,183
ඉන්වෙන්ට්‍රි - ලිපිද්‍රව්‍ය	531,269.50	1,330,395	1,810,331	1,088,162	1,024,689	1,799,717	1,422,223	1,747,782	570,731	1,918,570
පිරියත සහ උපකරණ										187,089
වෙළඳ සහ අනෙකුත් ලැබීම්	13,785,777.61	23,016,165	27,986,450	27,992,790	63,306,415	77,829,168	32,654,272	60,926,113	34,261,785	22,376,953
අවිනිශ්චිත ගිණුම්	85,433.18	85,433	85,433	85,433	85,433	85,433	85,433	85,433	85,433	85,433
මුදල් සහ මුදල් සමාන දෑ	1,098,703	1,447,272	20,530,849	32,097,454	3,262,800	15,479,150	15,589,028	15,579,135	30,877,801	16,534,868
මුළු වත්කම්	252,978,397	446,280,439	491,741,429	507,223,655	605,096,722	700,493,296	716,274,264	781,451,005	718,115,202	2,333,173,601
ස්කන්ධය සහ වගකීම්										
ප්‍රාග්ධන සහ සංචිත (සංවර්ධන වැය)							3,576,819	5,584,122	11,658,355	12,960,393
සමුච්චිත අරමුදල්	479,139,884.34	622,470,805	786,670,223	736,621,992	749,318,173	830,564,132	822,051,587	802,744,130	788,025,807	809,753,648
අනෙකුත් ප්‍රදාන									14,234,250	
රජයේ ප්‍රදාන - AHEAD									1,628,640	5,076,864
සමුච්චිත අරමුදල් ආංශික සංවර්ධන වැඩසටහන(SSDP)				139,834,358	166,331,014	201,422,283	239,045,854	300,060,865	280,954,073	244,958,829
සමුච්චිත අතිරික්තය/ඌණතාවය	(252,274,180)	(322,689,668)	(384,274,070)	(466,618,875)	(435,126,654)	(445,391,295)	(514,416,548)	(518,985,846)	(528,338,308)	(573,655,678)
ප්‍රත්‍යාගණන සංචිත										1,673,211,343
බැදුම්කර අවලංගුවීම්										1,732,125
හිමිකම් එකතුව	226,865,704	299,781,138	402,396,152	409,837,475	480,522,533	586,595,120	550,257,712	589,403,271	568,162,817	2,174,037,524
ප්‍රාග්ධන නොවන වගකීම්										
පාරිනෝෂිත සඳහා වෙන් කිරීම්	12,963,851	29,208,293	38,714,128	46,082,397	33,775,589	45,331,680	63,379,169	69,939,906	79,028,671	86,992,943
ප්‍රාග්ධන වගකීම්										
උපචිත වියදම්	4,190,055.38	115,147,665	48,388,632	48,553,176	87,206,982	55,834,256	83,644,548	101,359,285	50,356,737	47,313,085
ගෙවිය යුතු දෑ	8,958,786	2,143,344	2,242,517	2,750,608	3,591,619	13,002,239	18,993,833	20,748,541	20,566,974	14,721,063
ගෙවීම් සඳහා වෙන්කිරීම්										10,108,975
ප්‍රාග්ධන වගකීම් එකතුව	13,148,842	117,291,009	50,631,149	51,303,784	90,798,601	68,836,495	102,638,381	122,107,826	70,923,711	72,143,123
මුළු වගකීම්	252,978,397	446,280,439	491,741,429	507,223,656	605,096,723	700,763,295	716,275,264	781,451,005	718,115,201	2,333,173,601

.....

පී.ඒ.එස්. නලින් ආර්. පෙරේරා - අධ්‍යක්ෂ මූල්‍ය
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

P.A.S. Nalin R. Perera
DIRECTOR FINANCE
Ocean University of Sri Lanka
Crow Island, Mattakkuliya,
Colombo 15.



අධ්‍යාපන අමාත්‍යාංශය,
නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு
திறன் அபிவிருத்தி மற்றும் தொழில்சார் கல்வி பிரிவு
Ministry of Education,
Skills Development & Vocation Education Division